# (Luther and Vatican II: ‘Liturgical Reform Experiment’ of the *Kithu Dana Pubuduwa* (renewal movement) in the Sri Lankan Catholic Church)

## ලූතර් සහ දෙවන වතිකාන කතිකාවත : කිතු දන පුබුදු ජන වන්දනා ප්‍රතිසංස්කරණ  පර්යේෂණ


ඩබ්.සුනෙත් ප්‍රනාන්දු*

office@pubuduwa.org



**සංක්ෂේපය**

කිතුනු පූජකයෙකු වූ මාටින් ලූතර් එදා අභියෝග කරනු ලැබුයේ කිතුනු ආයතනයකට මිස ජේසු සමිඳාණන් මෙලොවට ඉදිරිපත් කළ කිතුනු දර්ශනයට හෝ ඉගැන්වීමට නොවේ.  ප්‍රතිසංස්කරණ තුළින් එතුමන් බලාපොරොත්තු වූයේ ජේසු සමිඳාණන් ඉදිරිපත් කළ නිවැරදි ඉගැන්වීම වෙතට සභාව නැවත කැඳවාගෙන යෑමය.  මන්ද, එවකට පැවති ගතානුගතික හා දැඩි ආයතනික රාමුවක හිරවී ක්‍රියා කිරීම හමුවේ සිදුවූයේ තවදුරටත් ජේසු සමිඳාණන් ඉදිරිපත් කළ දේව රාජ්‍යයේ වටිනාකම් වලින් හෙබි නව දැක්ම විනාශ වී යෑමය. නාසරතයෙන් නික්මුනේ ජීවිත පූර්ණත්වයක් කරා රැගෙන යන වැඩපිළිවෙලක් මිස නීති රීති අණ පණත් ඉටු කිරීමක් හෝ සංස්ථාගත ආයතනයක් පවත්වා ගෙන යෑමක් නොවන්නේය.  ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භයේදී  එවකට බලධාරීන් කුමන අයුරින් එය දෙස බැලුවද වර්ථමානය වන විට ශු. සභාව තුළ ප්‍රගතිශීලී ප්‍රගමනයකට යොමු වී ඇති අන්දම දැකගත හැකිය.

වර්ථමාන සමාජ ප්‍රවාහය තුළ නව අර්ථයක් දෙමින් ජනතාව අතරට සුභාරංචිය ගෙන යෑමට ගනු ලබන සෑම පියවරකම  ලූතර්ගේ හඬ ප්‍රතිරාව ඉඟි කරයි. මෙය විවිධ පුද්ගලයන් මඟින් ද ආයතන මඟින් ද වර්ථමානය දක්වා සිදු වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ කිතු දන පුබුදුව තුළින් ද මෙවන් පර්යේෂණයක් සිදු විය.  එය අද දක්වාම සිදුවෙමින් පවතී.  ඒ අනුව කාලීන ප්‍රතිසංස්කරණ සමඟ දේව වන්දනාව හා නමස්කාරය වෙත යොමු වූ ආකාරය මේ ලිපියේ  වස්තු බීජය වේ.  ලූතර් ඇරඹූ ඓතිහාසික ක්‍රියාවලියට සමස්ත සභාවම යොමු වූයේ දෙවෙනි වතිකාන මන්ත්‍රණ සභාව මගින් යයි තර්ක කළ හැක.  එහි ආභාසය ලබමින් සිදු වූ මෙම ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිඵලය වූයේ සහභාගිශීලී සභාවක් වෙත යොමු වීමය. නව ප්‍රතිසංස්කරණ මාවතකට ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ මඟ විවර කළ කිතු දන පුබුදුව ද තම සාක්ෂි දැරීමේ ජීවනාලිය ලබා තිබෙනුයේ දේව වන්දනාව හා නමස්කාරයට ජනතා සහභාගිත්වය තුළින් ලැබූ අත්දැකීමේ ප්‍රතිඵලයක් හරහා ය.

මෙම සියළු ප්‍රතිසංස්කරණ කතෝලික සභාව තුළ සිදුවීම මන්දගාමී වුවද, ජන වන්දනා ප්‍රතිසංස්කරණ සඳහා ඉඩකඩ හා අවස්ථා ලබා දීම තව දුරටත් සිදුවිය යුතුය. එලෙසම මෙම ප්‍රතිසංස්කරණ සිදුවී වසර ගණනාවක් ගත වුවද එය සමස්ත කිතුනු ගිහි ජනතාව වෙත මෙන්ම පූජකයන් හා පැවිද්දන් වෙතද ගමන් කිරීම සිදුවූයේ ඉතාමත් සෙමිනි. ඉදිරි කාල සීමාවේදී සියල්ලන් වෙත මෙම ප්‍රතිසංස්කරණ අත්දැකීමට මං විවර කළ යුතුය. තවදුරටත් පුහු ආටෝපය හා ගතානුගතිකත්වයෙන් මිදී තම ගතින්, සිතින් හා මනසින් මුළුමනින් දෙවිඳුන් අත්දැකීමට ද එහිම ප්‍රතිඵලයක් ලෙස ඊට සාක්ෂි දැරීමේ නව මාවත් සොයා පා නැඟීම ද සිදුවිය යුතුය. එය සැබවින්ම ලූතර් ප්‍රතිසංස්කරණ ද අභිබවා ගිය දෙවෙනි වතිකාන කතිකා පුනරුදය ජනිත කළ ජන නිර්මාණශීලී බවේද සංකලනයක් ලෙස මෙහිදී තර්ක කරමු.



**මූලික පදඃ** ප්‍රතිසංස්කරණ  , ජන වන්දනාව , ජන සහභාගිත්වය , නමස්කාර ක්‍රියා , ගිහි පිබිදීම , සංස්කෘතික පර්යේෂණ


---

*රෝමයේ උර්බානියානු සරසවියට අනුබද්ධ කොළඹ අගරදගුරු පදවියේ සාන්ත ජුසේ වාස් දේවධර්ම නිකේතනයේ උපාධිය ද BA (Rome), කැළණිය විශ්ව විද්‍යාලයේ 2014 ක්‍රිස්තියානි අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති MA (Kelaniya) උපාධිධාරියෙකු වූ, පුබුදු සංසයේ සුබැඳි පූර්ණ කාලිකනයෙකි.